**"X"**

<u>කොළඹ දිසා අධිකරණයේදී ය.</u>

කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවතේ, අංක.167/4 දරණ ස්ථානයේ නිහාල් ශ්‍රී අමරසේකර.

<u>පැමිණිලිකරු.</u>

| | | |
|---|---|---|
| නඩු අංකය | : 3155/විශේෂ | එදිරිව |
| ස්වභාවය | : විශේෂ | |
| වටිනාකම | : රු.100,000/- | |
| කාර්ය පටිපාටිය | : සාමාන්‍ය | |

1. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, චියෝඩා-කු, ඕටමචි 1-චෝම් හි 2-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන සහ කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක.315, දරණ ස්ථානයේ, ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන මිට්සුයි ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්.

2. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, ෂින්ජුකු-කු, නිෂි-ෂින්ජුකු 1-චෝම් හි 25-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන හා මහරගම, හයිලෙවල් පාරේ, අංක.65 දරණ ස්ථානයේ ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන තායිසෙ කෝපරේෂන්.

3. ජාපනයේ නීති යටතේ නිසි ලෙස සංවිධානය වී තිබෙන සංස්ථාවක් වන සහ ජපානයේ ටෝකියෝ නුවර, මිනාටෝ-කු, අටාගෝ 1-2-2, මොරි ගොඩනැගිල්ලේ අංක.9 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන ගෘහ නිර්මාණ ශිල්පීන්

සහ සැලසුම්කරුවන් වන කන්තො කිකාකු සෙක්කිෂා යෝෂෝ ෂිබාටා ඇන්ඩ් ඇසෝෂියේට්ස්.

4. කලින් ලංකා ජැපෑන් හොටෙල්ස් ලිමිටඩ් වශයෙන් හැඳින් වූ සහ කොළඹ 03, ඇල්ප්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයේ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ්.

5. කොළඹ 03, ඇල්ප්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයෙහි හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ කෝර්නල් ලයනල් පෙරේරා.

6. කොළඹ 03, ධර්මපාල මාවතේ, අංක.51/3 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ ප්‍රෙඩ්රික් ජර්මේන් නොයෙල් මෙන්ඩිස්.

7. කොළඹ 07, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවතේ, අංක.23/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කයිර්ෂාස්ප් නරිමාන් චොක්සි.

8. කොළඹ 06, හැව්ලොක් පාරේ, අංක.696/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ දොන් පීටර් සෙවරිනස් පෙරේරා.

9. ජාපනයේ, කසගාව, චිගසාකි, ෆුජිමිචෝ, 6-38 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කඹුටාකා කොබෝයි.

10. කොළඹ 06, රාමක්‍රිෂ්ණා මාවතේ, අංක.4 දරණ ස්ථානයේ සහ හොටෙල් ඉඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කනපතිපිල්ලේ ශන්මුගලිංගම්.

11. දැනට කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක.315 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කොජි ඉතෝ.

**විත්තිකරුවෝ.**

**ඉහත නම් සඳහන් 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන් වෙතය.**

(ඔවුන්ගේ ලේඛණගත නීති උපදේශක කොළඹ 12, බෙල්මන්ට් වීදියේ, අංක.15 හි රජ්මාරා ආබ්දීන් මහතා මඟින් භාර කරවනු පිණිස)

ඉහත නම් සඳහන් 1 වැනි සහ 2 වැනි විත්තිකරුවන්ගෙන් ප්‍රශ්න කිරිම සඳහා ඉහත නම සඳහන් පැමිණිලිකරු වෙනුවෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 94 වන වගන්තිය අනුව ප්‍රශ්න විචාරණ,

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 94 වගන්තිය ප්‍රකාර, පහත සඳහන් සියළුම විචාරණයන්ට, මෙය භාරදීමේ දී සිට, **දින දහයක් (10)** ඇතුළත ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලබේ.

1. ඉහත නම් සඳහන් 4 වැනි විත්තිකාර සමාගමේ සංස්ථා ප්‍රකාශ පත්‍රයේ නම් කරනු ලැබූ ප්‍රවර්ධකයින් ඔබ වූ බව හා ඔබගේ බලයලත් අත්සන්කරුවෝ මඟින් එයට අත්සන්කරුවන් වූ බව ඔබ පිළිගන්නෙහු ද? එසේ නොමැති නම්, ඒ ඇයි?

2. ඔබගේ නියෝජිතයා සහ/හෝ නම් කරනු ලැබූ අධ්‍යක්ෂවරයාගේ පැමිණීමක් නොමැතිව, 4 වැනි විත්තිකාර සමාගමේ කොටස්කරුවන්ගේ සහ/හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ මහා සභා රැස්වීමක් සංස්ථාපිත කළ නොහැකි බව ඔබ පිළි ගන්නෙහු ද? එසේ නැතිනම් ඒ කෙසේ ද?

3. 4 වන විත්තිකාර සමාගමේ සංගමික ව්‍යවස්ථාවලිය 129 වැනි වගන්තිය යටතේ,ඔබගේ නම් කරනු ලැබූ අධ්‍යක්ෂවරයාගේ එකඟත්වය ප්‍රකාශ කිරීමේ ඡන්දය නොමැතිව කිසිදු තීරණයක් ගැනීමට සහ/හෝ කිසිදු යෝජනා සම්මත කිරීමක් එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක දී 4 වැනි විත්තිකාර සමාගමට කළ නොහැකි බව ඔබ පිළි ගන්නෙහු ද?

4. සමාගම් ව්‍යවස්ථාවලියේ 129 වැනි ව්‍යවස්ථාව යටතේ බලතල යෑදීම මත කරනු ලැබූ ඔබගේ ඉල්ලීම පිට එකී 4 වැනි විත්තිකාර සමාගමේ 1990.03.31 වැනි දිනෙන් අවසන් වූ වසරට ගිණුම් එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළිගත් බව ඔබ පිළි ගන්නෙහු ද? එසේ නැතිනම් ඒ මන්ද?

5. මෙම නඩුවට අදාළ වන්නා වූ සියලු කල් හිදී ම 4 වැනි විත්තිකාර සමාගමේ එදිනෙදා පරිපාලනය, කළමණාකරණය සහ කටයුතු පූර්ණ ලෙසින් භාරව ඔබගේ නියෝජිතයෙකු එකී 4 වැනි විත්තිකාර සමාගමේ පූර්ණකාලීන නේවාසික විධායක අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කළ බව ඔබ පිළි ගන්නෙහු ද? එසේ නැතිනම් ඒ මන් ද?

6. ඔබගේ නියෝජිතයෙකු වූ, එම විධායක අධ්‍යක්ෂවරයෙකු මඟින් කොළඹ හිල්ටන් හෝටල් ව්‍යාපෘතියේ නිර්මාණ ශිල්පින් වශයෙන් 3 වැනි විත්තිකරුගේ කටයුතු නියම කරමින් ඔහුට උපදෙස් දුන් බව ඔබ පිළිගන්නෙහු ද?

7. කොළඹ හිල්ටන් හෝටල ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන්/සැපයුම්කරුවන් වශයෙන් වූ ඔබගේම වැඩවල නිවැරදිතාවය නියම කිරීමට සහ අධීක්ෂණය කිරීමට, වෘත්තීමය වශයෙන් සහ ගිවිසුම්ගතව 3 වැනි විත්තිකරු කෙලින්ම බැඳී නොසිටියේ ද? එසේ නැතිනම් ඒ මන්ද?

8. ඔබ විසින් ඉදි කරනු ලැබුවා වූ කොළඹ හිල්ටන් හෝටලය ක්‍රියාකාරිත්ව කටයුතු සඳහා විවෘත කිරීමෙන් පසුව එහි අමුත්තන්ගේ කාමර සංඛ්‍යාවේ නිවැරදිතාවය පිළිබඳව 1987 දී පැමිණිලිකරු විසින් ප්‍රශ්න මතු කරන ලද්දේ ද?

9. 3 වැනි විත්තිකරු විසින් අවසන් සහතිකය නිකුත් කිරීමට පෙරාතුව ස්වාධීන ඉංජිනේරුවරයෙකු ලවා කොළඹ හිල්ටන් හෝටලය පිළිබඳව ස්වාධීන වගවිභාගයක් සහ භෞතික හරිවැරදිතා පිරික්සුමක් පැවැත්වීමට ඔබ විරුද්ධ වී වැළැක්වූ බව ඔබ පිළි ගන්නෙහු ද?

10. ඉහත නම සඳහන් 7 වැනි විත්තිකරු ඔහුගේ 1988.08.08 දිනැති ලිපියෙන් එවැනි විරුද්ධතාවයකට ඔබට සහයෝගය දුන් බව ඔබ පිළි ගන්නෙහු ද? එසේ නැතිනම් ඒ මන්ද?

11. රජය විසින් නම් කරනු ලැබූ අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් අර්නස්ට් සහ යං සමාගමේ ප්‍රධාන කොටස්කරු ගණකාධිකාරි එම්.ටී.එල්.ප්‍රනාන්දු මහතා විසින් එවැනි ස්වාධීන වග විභාගයක් ඉල්ලා සිටි බව ඔබ පිළි ගන්නෙහු ද?

12. ඉහත කී පරිදි ඉල්ලා සිටි අයුරු එවැනි ස්වාධීන වග විභාගයක් කිසි විටෙකවත් නොපැවැත් වූ බව ඔබ පිළිගන්නෙහු ද? එසේ නැතිනම් ඒ මන්ද?

13. ඔබගේ නියෝජිතයින් මගින් ඔබ පෙනී සිටි, එකී 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ මුදල් අමාත්‍යාංශයේ රැස්වීම්වලදී අමුත්තන්ගේ කාමර සහ මහල්වල අඩුකම් පැමිණිලිකරු විසින් පෙන්වා දෙනු ලැබූ බව ඔබ පිළිගන්නෙහු ද?

14. කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරිම සඳහා වූ ඉදි කිරිමේ ගිවිසුමෙහි වෙනත් දේ අතර මහල් 22 ක් නියමකර තිබූ බව ඔබ පිළිගන්නෙහු ද?

15. ඔබ විසින් අත්සන් කර ඉදිරිපත් කරන ලද සහ නිර්මාණ ශිල්පීන් 3 වැනි විත්තිකරු විසින් ද සහතික කරනු ලැබූ කොළඹ හිල්ටන් හෝටලය ඉදි කිරිම පිළිබඳ වූ මාසික ප්‍රගති වාර්තාවන් හි ඔබ විසින් පිළිගෙන සහතික කර ඇති ප්‍රකාර කොළඹ හිල්ටන් හෝටලයේ මහල් සංඛ්‍යාව 20 ක් පමණක් වූ බව ඔබ පිළි ගන්නෙහු ද?

16. 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මෙම නඩුවට අදාළ කාරණයන් පිළිබඳ කථාබහ සාකච්ඡා කර සලකා බැලීමේ දී එම කථා බහ සාකච්ඡාවලට ඔබගේ නියෝජිතයන් මගින් සහභාගී වූවෝ ද?

17. මෙම නඩුවට පාර්ශවකාර විත්තිකරුවෙකු වීමෙහි ලා සහ මෙම නඩුවට ඔබගේ සම්බන්ධතාවයන් 4 වැනි විත්තිකාර සමාගමේ සම්බන්ධතාවයන් හා ප්‍රතිවිරුද්ධ ගැටෙන බැවින්, ඔබ එවැනි කථාබහ සහ සාකච්ඡාවන්ට ඔබගේ නියෝජිතයන් මගින් සහභාගී නොවූයේ නම් ඒ මන්ද?

18. 4 වැනි විත්තිකාර සමාගමේ එවැනි සාකච්ඡා කථාබහට ඔබගේ නියෝජිතයින් මගින් වූ සහභාගීත්වය 4 වැනි විත්තිකාර සමාගමේ සම්බන්ධතාවයන් අගතිගාමී බලපෑමක් සහ එම සම්බන්ධතාවයන් ස්වාධීනව තක්සේරු කිරීමට බාධාවක් වූ බව ඔබ පිළි ගන්නේ ද? එසේ නැතිනම් ඒ මන්ද?

19. එකී 4 වැනි විත්තිකාර සමාගමේ උත්තරය මෙම නඩුවේ අධිකරණයට ඉදිරිපත් කිරීමට පෙරාතුව, එහි පිටපතක් ඔබ සහ/හෝ ඔබගේ අනුයෝජකයින් සහ/හෝ නියෝජිතයින් විසින් ලද්දේ ද?

20. එසේ ලද්දේ නම් 4 වැනි විත්තිකාර සමාගමේ එම උත්තරයෙහි පිටපතක් ඔබ සහ/හෝ ඔබගේ අනුයෝජකයින් සහ/හෝ නියෝජිතයින් වෙත ලැබුනේ කවරෙකුගෙන් ද?

21. මෙම නඩුවේ 4 වැනි විත්තිකාර සමාගම විසින් ගොනු කරන ලද උත්තරය සකස් කිරීමේ දී ඔබ සහ/හෝ ඔබගේ අනුයෝජිතයින් සහ/හෝ නියෝජිතයින් කිසියම් හෝ ආකාරයක අදහස් ප්‍රකාශයක් සහ/හෝ සාකච්ඡාවක් සහ/හෝ එසේ නැතිනම් සහාය දීමක් කරන ලද්දේ ද? එසේ නම් කවුරුන් සමඟින් ද? එසේ සහාය දෙනු ලැබුවේ කා හට ද?

22. එකී උත්තරය ගොනු කිරීමට පෙරාතුව සහ/හෝ ඉන් අනතුරුව ඔබ සහ/හෝ ඔබගේ අනුයෝජකයින් සහ/හෝ නියෝජිතයින් එම උත්තරයට අදාළ කාරණයන් පිළිබඳව 4 වැනි විත්තිකාර සමාගමේ නියෝජිතයින්/නිළධාරීන් සමඟ සහ/හෝ ඔබගේම නියෝජිතයින් හැර එහි අධ්‍යක්ෂකවරුන් කිසිවකු සමඟ හෝ සාකච්ඡා කරනු ලැබූවෝ ද? එසේ නම් ඒ කා සමඟ ද?

23. 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වල දී පැවති එකී උත්තරය පිළිබඳ වූ කාරණයන් පිළිබඳව කථාබහ සහ සාකච්ඡා කිරීමේ දී සහ සලකා බැලීමේ දී ඔබ සහ/හෝ ඔබගේ නියෝජිතයින් සහභාගී වූවෝ ද?

24. එකී 4 වැනි විත්තිකාර සමාගමේ උත්තරය සකස් කිරීමේ කාර්යය සඳහා එකී 4 වැනි විත්තිකාර සමාගමේ විධායක අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කළ ඔබගේ නියෝජිතයින්ගේ කල් ක්‍රියාව සහ ක්‍රියා මාර්ගයන් පිළිබඳව ඔබ විසින් 4 වැනි විත්තිකාර සමාගමට උපදෙස් දෙන ලද්දේ ද?

25. මෙම නඩුවේ නිකුත් කරනු ලැබූ වාරණ නියෝග සහ/හෝ අතුරු තහනම් නියෝග පවතිද්දී ඔබ 4 වැනි විත්තිකාර සමාගමේ නිළධාරීන්/නියෝජිතයින් සහ/හෝ ශ්‍රී ලංකා රජයේ නිළධාරීන්/නියෝජිතයින් සමඟ සම්මුති සාකච්ඡාවලට එළඹ, ඔබගේ ඉල්ලීම් මත අඩු කිරීම් සහ/හෝ කපා හැරීම් ඔබ විසින් යෝජනා කරන ලද්දේ ද? එසේ නම් ඒ කවුරුන් සමඟ ද? කවුරුන් ඉදිරියේ ද?

26. 1990 පෙබරවාරි මස හෝ එයට ආසන්නයේ දී මූලික ණය මුදලේ මුල් මුදල/ප්‍රාග්ධනයෙන් 30% ක කපා හැරීමක් කළයුතු බවට මුදල් අමාත්‍යාංශය විසින් ඔබගෙන් අවශ්‍ය කළ බව ඔබ පිළි ගන්නෙහු ද?

27. අමුත්තන්ගේ කමාර 452 ක පදනමක් මත ඔබ විසින් පිළියෙල කොට ඉදිරිපත් කරනු ලැබූ ප්‍රකාශ පත්‍රය සහ පූර්වානුමාන ලාභදායකත්වය සහ මුදල් ගැලීමේ ප්‍රක්ෂේපනය අනුව හෝටලයේ අමුත්තන්ගේ කාමර සංඛ්‍යාවේ අඩුකම පිළිබඳව එම අවස්ථාවේ දීම මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රශ්න මතුකළ බව ඔබ පිළිගන්නෙහි ද?

28 මෙම නඩුවෙහි පැමිණිල්ලෙහි සඳහන් කර ඇති රජයේ ඇප සහතික පත් ප්‍රදානය කරන ලද්දේ, වෙනත් කරුණු අතර, ණය මුදල් ආපසු ගෙවීමේ හැකියාම පෙන්නුම් කළ ඔබගේ එකී පූර්වානුමාන ලාභදායකත්ව ප්‍රකාශ සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපණයන් පදනම් කොටගෙන නොවේ ද? එසේ නැත්නම් ඒ කුමන පදනමක් මත ද?

29. මූලික ණය මුදලේ මුල් මුදල/ප්‍රාග්ධනය මත 30% ක් කපා හැරීමේ ඉහත කී අවශ්‍යතාවය ඔබගේ නියෝජිතයින්ට සහ/හෝ ඒජන්තවරුන් වෙත 1990 පෙබරවාරි මස හෝ ඊට ආසන්නයේ දී මුදල් අමාත්‍යාංශයේ දී දන්වා සිටින ලද්දේ 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරියේ දී බව ඔබ පිළි ගන්නෙහු ද?

30. 4 වැනි විත්තිකාර සමාගමේ සමහර අධ්‍යක්ෂවරුන් සමඟ ඔබගේ නියෝජිතයින් පැමිණ සිටි, 1990 මාර්තු මස හෝ එයට ආසන්නයේ දී මුදල් අමාත්‍යාංශයේ දී පැවති පසු සාකච්ඡාවන් හි දී, මූලික ණය මුදලේ මුල් මුදල/ප්‍රාග්ධනයෙන් 30% ක් ඉහත කී කපා හැරීම තවදුරටත් ස්ථිර කරනු ලැබූ බව ඔබ පිළිගන්නෙහු ද?

31. හෝටලයේ අමුත්තන්ගේ කාමර සංඛ්‍යාවේ වැදගත් අඩුකම, එනම්, කාමර සංඛ්‍යාව 452 සිට 387 දක්වා වූ අඩුව මත වූ ප්‍රශ්න මතු කිරීම් 1990 මාර්තු මස හෝ ඊට ආසන්නයේ දී මුදල් අමාත්‍යාංශයේ දී 4 වන විත්තිකාර සමාගමේ සමහර අධ්‍යක්ෂවරුන් සමඟ ඔබගේ නියෝජිතයින් පැමිණ සිටියදී වැඩිදුරටත් ස්ථිර වූ බව ඔබ පිළිගන්නෙහි ද?

32. හෝටල් අමුත්තන්ගේ කාමර 452 ක පදනමක් මත ගණන් බලනු ලැබුවා වූ ලාභදායි පූර්වානුමාන ප්‍රකාශ සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපණයන් පදනම් කොටගෙන රජයේ ඇප සහතික පත් ප්‍රදානය කරනු ලැබූ බව 1990 මාර්තු මස හෝ එයට ආසන්නයේ දී පැවති සාකච්ඡාවන් හිදී මුදල් අමාත්‍යාංශය විසින් ඔබගේ නියෝජිතයින් වෙත දන්වා සිටි බව ඔබ පිළි ගන්නෙහු ද?

33. ඉහත කී මූලික තත්ත්වයෙන් කිසියම් වෙනස්කමක් සිදුවීම රජයේ තත්ත්වයට බලපානු ලබන බව ඉහත කී සාකච්ඡාවන්හිදී මුදල් අමාත්‍යාංශය විසින් ඔබගේ නියෝජිතයින් වෙත දන්වා සිටින ලද බව ඔබ පිළි ගන්නෙහු ද?

34. ඉහත නම සඳහන් නිර්මාණ ශිල්පීන් 3 වැනි විත්තිකරුගෙන් නියත කරුණු දැක්වීමක් ලැබෙන තෙක් ඔබ වෙත කිසිදු මුදලක් ගෙවීම සම්බන්ධයෙන් 1989 නොවැම්බර් සහ 1989 දෙසැම්බර් මාසයන් හි පැවැති 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී පැමිණිලිකරු විසින් විරෝධතාවයන් නොනගන ලද්දේ ද? එසේ නැතිනම්, පැමිණිලිකරු ප්‍රකාශ කර සිටියේ කුමක් ද?

35. පොදුජන කොටස්කරුවන්ගේ ප්‍රාග්ධන කොටස ඔවුන් වෙත ආපසු ගෙවිය යුතු යයි ඒ අවස්ථාවේ දීම පැමිණිලිකරු විසින් යෝජනා නොකරන ලද්දේ ද? එසේ නැතිනම්, ඔහු කිය සිටියේ කුමක් ද?

36. ඔබලා වෙත එක්සත් ජනපද ඩොලර් 2.0 මිලියනයක මුදලක් මුදා හැර ගැනීම සඳහා, 1990 ජනවාරි මස හෝ ඊට ආසන්නයේ දී ඔබගේ නියෝජිතයින්, ඉහත නම් සඳහන් 5 වැනි සහ 7 වැනි විත්තිකරුවන් සමඟ ගොස් මුදල් අමාත්‍යාංශයේ නිළධාරීන් හමු නොවූයේ ද? එසේ නොවූයේ නම්, එවැනි හමුවීමක් සිදුකළේ මන් ද?

37. එවැනි රැස්වීමක ප්‍රතිඵලයක් වශයෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 2.0 ක් ඔබ වෙත ගෙවනු නොලැබුවේ ද?

38. ඉහත සඳහන් හමුවීම් පවත්වන ලද්දේ ද, එයට පෙරාසන්නයේ ම 1989 නොවැම්බර් සහ දෙසැම්බර් හිදී, පැවැති ඉහත සඳහන් 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී පැමිණිලිකරු විසින් ප්‍රකාශ කරන ලද අදහස් මඟ හැරීමට සහ එය නොසලකමින් නොවන්නේ ද? එසේ නොවන්නේ නම එවැනි රැස්වීමක් යොදා ගනු ලැබුවේ ඇයි?

39. පැමිණිලිකරු විසින් ගනු ලැබූ ඉහත සඳහන් තත්ත්වය ඉහත කී එම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී විරුද්ධත්වයකින් තොරව නොවූයේ ද? එසේ නොවූයේ නම් විරුද්ධ වූයේ කවුරුන් ද?

40. ඉහත සඳහන් එක්සත් ජනපද ඩොලර් 2.0 මිලියනයක මුදලක් මුදාහැර ගැනීමකට මුදල් අමාත්‍යාංශයේ එකඟත්වය ලබා ගන්නා ලද්දේ ඉහත කී 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ දී ඉහත කී තත්ත්වය පිළිබඳව පූර්ණ එළිදරව්වක් නොකිරීමෙන් නොවේ ද? එසේ නැතිනම්, එළිදරව් කළේ කුමක් ද?

41. ඔබට කිසිදු මුදලක් ගෙවනු ලබනවාට පැමිණිලිකරු විරුද්ධ වී එකී 3 වැනි විත්තිකරුගෙන් නොයෙකුත් නියත කරුණු දැක්වීමක් ඉල්ලා සිටිම ගැන 1990.02.21 දින හෝ ඊට ආසන්නයේ දී ඔබගේ නියෝජිත එච්.ඕගාමි මඟින් ඔබ 7 වැනි විත්තිකරුට ලියා දැන්වූ බව ඔබ පිළිගන්නෙහි ද? එසේ නැත්නම්, ඔබ ලියා යැව්වේ කුමක් ද?

42. නිර්මාණ ශිල්පීන් වන 3 වැනි විත්තිකරුගෙන් එවැනි කරුණු දැක්වීමක් අනවශ්‍ය බවත්, ඔබ වෙත ගෙවීම් කළ හැකි බවත් 1990.02.28 දින දරණ ලිපිය අනුව 7 වැනි විත්තිකරු ලියා දන්වා සිටියේ ද? එසේ නැතිනම් ඔහු කියා සිටියේ කුමක් ද?

43. ඉහත සඳහන් එක්සත් ජනපද ඩොලර් 2.0 මිලියනයක ගෙවීම ඉන්පසුව ඔබලා වෙත ගෙවනු ලැබුවේ ද?

44. පැමිණිලිකරු විසින් ඉහත සඳහන් වැදගත් විමසීම්/අඩුකම් මතුකර නිර්මාණ ශිල්පීන් 3 වැනි විත්තිකරුගෙන් ඒකාන්ත කරුණු දැක්වීමක් ඉල්ලා සිටීමෙන් පසුව භාණ්ඩාගාරයේ ලේකම් වෙත 75% ක පාලනමය අයිතියක් සැලසීම සඳහා ඔබගේ කොටස් හිමිකම්වලින් කොටසක් මහා භාණ්ඩාගාරයේ ලේකම් වෙත පැවරීමට ඔබ යෝජනා කර සිටියෙහු ද? එසේ නැතිනම් ඔබ යෝජනා කර සිටියේ කුමක් ද?

45. ඉහත සඳහන් යෝජනාව කරන ලද්දේ ලිඛිතව ද? එසේනම්, එම ලේඛණයේ දිනය කවදා ද?

46. එවැනි යෝජනාවක් කරන ලද්දේ, ඔබ පාර්ශවකරුවකු නොව, මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් 4 වැනි විත්තිකාර සමාගමේ සමාගම් සංස්ථා ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීමට ඉඩ සැලසීමක් වශයෙන් ද? එසේ නම් ඒ මන් ද?

47. වෙනත් කරුණු අතර, ඉහත සඳහන් යෝජනා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ නිළධාරීන්/නියෝජිතයින් සමඟ ඔබ ඔබගේ නියෝජිතයින්/ඒජන්තවරුන් මඟින් කිසිදු සාකච්ඡා සහ/හෝ සම්මුති සාකච්ඡා කරන ලද්දේ ද? එසේ නම් ඒ කවුරුන් සමඟින් ද?

48. වෙනත් කරුණු අතර, ඔබ ඔබගේ නියෝජිතයින්/ඒජන්තවරුන් මඟින් ඉහත සඳහන් යෝජනා සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නිළධාරීන්/නියෝජිතයින් සමඟ ඔබ කිසිදු සාකච්ඡා සහ/හෝ සම්මුති සාකච්ඡා පවත්වන ලද්දේ ද? එසේ නම් ඒ කවුරුන් සමඟින් ද?

49. මෙම නඩුවට අදාළ වන්නා වූ කිසිදු හෝ කාරණයක් සම්බන්ධයෙන් ඔබ ඔබගේ නියෝජිතයින් මඟින් නීතිපති දෙපාර්තමේන්තුවේ නිළධාරීන්/නියෝජිතයින් සමඟ කිසියම් හෝ සාකච්ඡා කිරීමක් සහ/හෝ සම්මුති සාකච්ඡාවක් පවත්වන ලද්දේ ද? එසේ නම් ඒ කවුරුන් සමඟින් ද? කවදා ද?

50. මෙම නඩුවේ ගොන් කර ඇති (පැ6) මූලික ගිවිසුමේ 3 සහ 4 වැනි ව්‍යවස්ථාවන් හි නියමිත ඉදි කිරීම් කොන්ත්‍රාත්තුව සහ සැපයුම් කොන්ත්‍රාත්තුවේ මුළු කොන්ත්‍රාත්තු මිල ගණන මත සහ නියම කරනු ලැබූ කොන්දේසීන් ජපාන යෙන්වලින් සියයට දෙකයි දශම පහක (2.5%) වන්දියක් සඳහා වූ නියම කළ කොන්දේසි මත, ශ්‍රී ලංකාවේ කොළඹ හිල්ටන් හෝටල ව්‍යාපෘතියේ ප්‍රවර්ධනය සහ නිමාව පිළි ගැනීම ඔබ වෙත සපයන ලද ප්‍රවර්ධන සේවාවන් සහ ආධාර සම්බන්ධයෙන් 1 වැනි විත්තිකරු වන ඔබ, ඔබ වෙනුවෙන් ඔබගේ ඕවසීස් ඩෙවලොප්මන්ට් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් අංශයේ සාමාන්‍යාධිකාරී එම්.යෝෂියුචි විසින්

1983 අප්‍රේල් මස 08 වැනි දින අත්සන් කරනු ලැබ, එක්සත් ජනපදයේ ලියාපදිංචි සමාගමක් සමඟ මූලික ගිවිසුමකට ඇතුළත් වන ලද්දේ ද?

51. ඉහත සඳහන් පරිදි ඔබ වෙනුවෙන් ඔබගේ ඕවර්සීස් ඩෙවලොප්මන්ට් ඇන්ඩ් කොන්ස්ට්‍රක්ෂන් අංශයේ සාමාන්‍යාධිකාරී එම්.යෝෂියුචි විසින් අත්සන් කරුනු ලැබූ ඉහත කී ගිවිසුම වෙනුවෙන් 1 වැනි විත්තිකාර ඔබ විසින් 1984 අප්‍රොල් මස 01 වැනි දින නියමිත ජපාන යෙන් 340,000,000 (මිලියන තුන්සිය හතළිහක ජපාන යෙන්) ක වන්දි සඳහා නියම කරනු ලැබූ කොන්දේසි මාලාවක් ශ්‍රී ලංකාවේ කොළඹ හිල්ටන් හෝටල ව්‍යාපෘතිය ප්‍රවර්ධනය කිරීම සහ නිමාව දැක්ම සම්බන්ධයෙන් ඔබට සපයනු ලබන ප්‍රවර්ධන සේවාවන් සහ ආධාර සම්බන්ධයෙන් එක්සත් රාජධානියේ ලියාපදිංචි සමාගමක් සමඟ වැඩිදුර ගිවිසුමක් අත්සන් කරන ලද්දේ ද?

52. ඉහත සඳහන් ගිවිසුම්වල කොන්දේසිවලියන් හි වෙනත් දේ අතර, 1 වැනි විත්තිකාර ඔබ විසින් පහත සඳහන් ලේඛණ ලබාගෙන භාර ගැනිම ඇතුළත් වූ බව ඔබ පිළිගන්නෙහි ද?

(අ) (මෙහි මතු ''ණය ගිවිසුම'' ලෙසින් හඳුන්වනු ලබන) මිට්සූයි සහ තයිසෙ ණය දෙනු ලබන්නා ලෙසින් ද, හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම ණයකරු වශයෙන් ද 1984 ජනවාරි මස 31 වැනි දිනට ඇතුළත්ව අත්සන් කරන ලද ණය ගිවිසුමේ 'ඩී' අනුබද්ධයක් වශයෙන් වූ ශ්‍රී ලංකා රජයේ ඇප සහතික ලිපිය ලැබීම,

(ආ) ණය ගිවිසුමේ 6 වැනි ව්‍යවස්ථාවේ ගෙනහැර දක්වා ඇති පරිදි මිට්සූයි සමාගම විසින් සෑහීමට පත්වන ආකාරයේ ශ්‍රී ලංකාවේ නීතිපතිගේ මතය ලැබීම,

(ඇ) (මෙහි මත ''ආයෝජන ගිවිසුම'' ලෙසින් හඳුන්වනු ලබන) 1984 ක්වූ ජනවාරි මස 31 වැනි දිනට මිට්සූයි තයිසේ, සීමාසහිත කොර්නල් සහ සමාගම සහ ශ්‍රී ලංකාවේ රජය අතර ලියා අත්සන් කරන ලද හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) සමාගමේ අයෝජිනය කිරීම සඳහා වූ ගිවිසුමෙහි ගෙනහැර දක්වා ඇති පරිදි හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම සඳහා එය ක්‍රියාකාරී වූ දිනයේ සිට වසර 10 ක කාලසීමාවක් සඳහා ව්‍යවස්ථාපිත ආදායම් බදුවලින් පූර්ණ නිදහස් කිරීම,

(ඈ) ආයෝජන ගිවිසුමේ 17 වන ව්‍යවස්ථාවේ ගෙනහැර දක්වා ඇති පරිදි ණය ගිවිසුම යටතේ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) සමාගම විසින් ගෙවිය යුතු පොළී හෝ අනිකුත් ගෙවීම් මත සියලුම බදු පූර්ණ ලෙසින් නිදහස් කිරීම.

(ඉ) ආයෝජන ගිවිසුමේ 17 වන ව්‍යවස්ථාවේ නියමිත සියලුම ද්‍රව්‍යයන් සහ උපකරණයන් වෙනුවෙන් ආනයන බදු නිදහස් කිරීම.

53. වෙනත් දේ අතර, ඉහත සඳහන් සේවාවන් සඳහා වූ ඉහත කී ජපාන යෙන් 340,000,000 (ජපාන යෙන් මිලියන තුන්සිය හතළිහක්) වූ වන්දි මුදල් ඔබ විසින් හොංකොං, සෙන්ට්‍රල්, ක්වීන්ස් පාරේ, අංක.16-18 හි යුරෝපියන් ඒෂියන් බෑන්ක් හොංකොං හි අංක.10022558/06, -සී.එස්.ක්ලොපන්බර්ග් - දරණ ගිණුමට 1 වැනි විත්තිකාර ඔබ විසින් ගෙවිය යුතු බව පිළි ගන්නෙහි ද?

54. ඉහත සඳහන් කොන්දේසි මාලාවක් සපුරාලීමෙන් පසුව, ඉහත සඳහන් ගිවිසුම යටතේ වූ එක වන්දි මුදලක් 1 වැනි විත්තිකාර ඔබ විසින් වාරික දෙකකින් ටෝකියෝ බැංකුව මඟින් හොංකොං යුරෝපියන් ඒෂියන් බැංකුවේ ඉහත සඳහන් බැංකු ගිණුමට 1984 අප්‍රේල් සහ 1984 දෙසැම්බර් මාසවල දී බැර කරන ලද බව පිළි ගන්නෙහි ද?

55. ඉහත කී කොන්දේසි මාලාව මෙම නඩුවේ ගොනු කරන ලද 1984.01.31 දිනැති ආයෝජන ගිවිසුමේ (පැ.9) 17 වන ව්‍යවස්ථාවේ වෙනත් කරුණු අතර දැක්වෙන කොන්දේසීන්ම වන බව, වඩාත් විශේෂයෙන්ම එකී ආයෝජන ගිවිසුමට පාර්ශවරුවකු වූ කෝර්නල් සහ සමාගම විසින් සපුරාලිය යුතු 17.02 ව්‍යවස්ථාවේ දැක්වෙන කොන්දේසි බව ඔබ පිළි ගන්නෙහි ද?

56. ඉහත සඳහන් කොන්දේසි සපුරාලීමට වෙනත් කරුණු අතර, අවකාශ සලසා තිබූ ආයෝජන ගිවිසුමට බාහිරව, ශ්‍රී ලංකාවෙන් බැහැරට හොංකොං හි ගෙවීම් කිරීම සඳහා 1 වැනි විත්තිකරු වන ඔබ එවැනි අතිරේක ගිවිසුම් ඇති කරගනු ලැබුවේ මන් ද?

57. බහුතර කොටස් දරන්නා සහ ආයෝජන ගිවිසුමට පාර්ශවකරුවකු වශයෙන්, එවැනි අතිරේක ගිවිසුම් පිළිබඳව ශ්‍රී ලංකා රජය දැන සිටියේ ද? සහ එම අතිරේක ගිවිසුම් සඳහා සහ ඉහත සඳහන් කොන්දේසි සපුරාලීම සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව, හොංකොං හි ඉහත කී ගෙවීම් කිරීම සඳහා ශ්‍රී ලංකා රජයෙන් පූර්ව අනුමැතිය ලබා ගත්තෙහු ද? එසේ නොමැති නම් ඒ මන් ද?

58. වෙනත් කරුණු අතර, ශ්‍රී ලංකා රජයෙන් වූ ඇප සහතික ලිපි, නීතිපතිතුමාගේ මත ප්‍රකාශය ව්‍යවස්ථාපිත ආදායම් බදු නිදහස ශ්‍රී ලංකාවේ පොළී සඳහා බදු නිදහස සහ ශ්‍රී ලංකාවේ පූර්ණ රේගු බදු නිදහස හා සම්බන්ධයෙන් වූ ඉහත කී කොන්දේසීන් ශ්‍රී ලංකා රජයට පමණක් සලසා දිය හැකි සහනයක් වූ බව ඔබ පිළි ගන්නෙහු ද? එසේ නැතිනම් කවුරුන් විසින් ද?

59. එසේනම්, ශ්‍රී ලංකා රජය විසින් පමණක් ප්‍රදානය කළහැකි සහනයන්/නිදහස් කිරීම් සඳහා එවැනි ගෙවීම් ශ්‍රී ලංකාවෙන් බැහැරව හොංකොං හි කළේ කෙසේ ද? මක් නිසා ද?

60. ගරු මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් ඔහුගේ 1984 මාර්තු මස 02 දිනැති ලිපියෙන් එදිනම දරන නීතිපතුමාගේ මතය මත ක්‍රියා කරමින්, කොළඹ හිල්ටන් හෝටල ව්‍යාපෘතියට රේගු බදු නිදහසක් නොදිය යුතු බව නිර්දේශ කරන ලද බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ගරු ඇමතිතුමා කියා සිටියේ කුමක් ද? ගරු නීතිපතිතුමා ප්‍රකාශ කළ මතය කුමක් ද?

61. ඉන් අනතුරුව ගරු නීතිපතිතුමාගේ ඉහත කී මතයට ප්‍රතිවිරුද්ධ ඉහත නම් සඳහන් 7 වැනි විත්තිකරු විසින් 1984.03.06 දිනැති ලිඛිත මත ප්‍රකාශයක් කරුනු ලැබූ බව ඔබ පිළි ගන්නේ ද? එම මත ප්‍රකාශය මඟින් ශ්‍රී ලංකා රජය විසින් කොළඹ හිල්ටන් හෝටලයට රේගු බදු නිදහසක් සැලසීමට සිදු නොකළේ ද? කොළඹ හිල්ටන් හෝටලයට එවැනි රේගු බදු නිදහසක් පසුව ප්‍රදානය නොකළේ ද?

62. 1985 ජූලි මාසයේ දී සංශෝධිත සැලසුම් ලෙස නව නිර්මාණ සැලසුම් කට්ටලයක් නිර්මාණ ශිල්පින් වන එකී 3 වැනි විත්තිකරුගෙන් ලබා ගැනිමට 4 වැනි විත්තිකාර සමාගමේ හිටපු විධායක අධ්‍යක්ෂ ඔබගේ නියෝජිත ඒ.නකාට නොසැලසුවේ ද? එසේ නැත්නම්, එසේ සැලසුවේ කව්ද, සහ කෙසේ ද?

63. 1 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් එම නව නිර්මාණ සැලසුම් කට්ටලය ලබා ගැනිම යටපත් කිරිමට 4 වැනි විත්තිකාර සමාගමේ හිටපු කළමනාකාර අධ්‍යක්ෂ ඔබගේ නියෝජිත ඒ.නකාට නොසැලසුවේ ද? එසේ නැතිනම්, 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඒ බව දන්වා සිටියේ කවදා ද, එසේ නැත්නම් ඒ ගැන ගත් ක්‍රියාමාර්ගය කුමක් ද?

64. 4 වැනි විත්තිකාර සමාගමෙන් ප්‍රකාශිත ලිඛිත බලයක් සහ/හෝ අනුමැතියක් නොමැතිව 1985 ජූලි මාසයේ දී නිර්මාණ සැලසුම් ලබා ගැනිමට එකී 4 වැනි විත්තිකාර සමාගමේ කලින් විධායක අධ්‍යක්ෂ ඔබගේ නියෝජිත ඒ.නකාට නොසැලසුවේ ද? එසේ නැතිනම් මක්නිසාද, ඒ ගැන ඔබ ගත් ක්‍රියා මාර්ගය කුමක් ද?

65. 1985 ජුනි සහ ජූලි මාසවල පැවති ඉහත කී 4 වැනි විත්තිකාර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී පැමිණිලිකරුගේ නියමය ප්‍රකාර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරිම සඳහා කොළඹ හිල්ටන් හෝටලය ඉදි කිරිමේ ප්‍රගතිය පිළිබඳව ඔබගෙන් සහ 3 වැනි විත්තිකරුගෙන් වාර්තා අවශ්‍ය බවට තීරණයක් කරනු ලැබූ බව ඔබ පිළි ගන්නේ ද? එසේ නොමැති නම් එම අධ්‍යක්ෂ මණ්ඩලය ගත් තීරණය කුමක් ද?

66. සංශෝදිත සැලසුම් වශයෙන් නව නිර්මාණ සැලසුම් කට්ටලයක් ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කිරිම ඉහත කී මණ්ඩල තීරණය හිතාමතාම කඩ කිරිමක් සහ උල්ලංඝණය

කිරීමක් වන බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද? එසේ නම්, ඒ සම්බන්ධයෙන් ඔබ ගත් ක්‍රියා මාර්ගය කුමක් ද? එසේ නොකළේ නම් ඒ මන්ද?

67. 1985 ජූලි මස දී සංශෝධිත සැලසුම් වශයෙන් ඉහත කී නිර්මාණ සැලසුම් කට්ටලය ලබා ගැනිමෙන් නොයෙකුත් ගිවිසුම්/කොන්ත්‍රාත්තුවල නියත විධිවිධානයන් ඔබ විසින් කඩකර උල්ලංඝනය කර නොමැති ද? එසේ නැත්නම් ඒ මන් ද? එම ක්‍රියාව සැපයුම් කොන්ත්‍රාත්තුවට වැදගත් ලෙස බල නොපෑවේ ද? නැතිනම් ඒ මන් ද?

68. ඔබගේ ඉහත කී ක්‍රියාව මඟින්, රජය ද ඇතුළුව සියලුම පාර්ශවකරුවන් විසින් ලිඛිතව එවැනි සංශෝධනයකට ඇතුලත් වියයුතු බවට ඒ සම්බන්ධයෙන් ආයෝජන ගිවිසුමෙහි වූ නියත විධානයන් ඔබ විසින් කඩ කර හා උල්ලංඝනය කර නොමැත්තේ ද? එවැනි ලිඛිත ගිවිසුමකට ඇතුළත් වී නම් කවදා ද? නොමැති නම් ඒ මන් ද?

69. ඉහත සඳහන් රජයේ ඇප සහතික පත් ශ්‍රී ලංකා රජය විසින් ආයෝජන ගිණුමෙහි පාර්ශවකරුවන් වශයෙන් වෙනත් දේ අතර, ඔබ වෙත නිකුත් කරනු ලැබුවේ, එම ආයෝජන ගිණුම පදනම් කරගෙන බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් කුමන පදනමක් මත ද?

70. ඉහත සඳහන් පරිදි එකී ආයෝජන ගිවිසුම ඔබ විසින් එහි පාර්ශවකරුවන් වශයෙන් කඩකර උල්ලංඝනය කිරිම මඟින් එම ඇප සහතික පත් බල රහිත කිරිම සිදුකර ඇති බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නොවන්නේ නම් ඒ මන් ද?

71. පිළිවෙලින්, 1984 ජනවාරි සහ 1984 මාර්තු මාසයන්හිදි 4 වැනි විත්තිකාර සමාගම සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරනු ලැබූ මූලික නිර්මාණ සැලසුම්වල සියලුම පිටපත් ඔබගේ ඉදි කිරීමේ වැඩබිමේ කාර්යාලයේ ඇති වූ ගින්නෙන් දැවී විනාශ විය නොහැකි බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ වූයේ නම් ඒ කෙසේ ද?

72. 4 වැනි විත්තකාර සමාගමේ කාර්යාලයෙහි භාරව තිබූ ඉහත කී නිර්මාණ සැලසුම්වල අයිතිකරුගේ පිටපත ප්‍රශ්නයට තුඩු දෙන අයුරින් අස්ථානගත වී සහ/හෝ හිතාමතාම වසන් කොට ඇති බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම්, ඒ මන්ද, එසේනම් එම කාර්යාලය භාරව විධායක අධ්‍යක්ෂ වශයෙන් සිටි නිසා ඒ සම්බන්ධයෙන් ඔබ ගත් ක්‍රියා මාර්ගය කුමක් ද? එසේ නැතිනම් ඒ මන් ද?

73. 3 වැනි විත්තිකරුගේ වැඩ නිම කිරීමේ සහ අවසන් සහතික හුදෙක් සුළු වෙi සහතිකවල ස්වභාවයේ ලිපි බව සහ පසුව සංශෝධිත සැලසුම් ලෙසින් ඉදිරිපත් කර ඇති නව නිර්මාණ සැලසුම් කට්ටලයට අදාළ බව හිතාමතාම එහි වසන් කොට සහ/හෝ එළිදරව්

කිරීමට ඔවුන් ක්‍රියා කර ඇති බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම්, එළිදරව් කර ඇත්තේ කුමක් ද? එසේ නම්, ඔබ ඊට පසු, ඔබ ගත් පියවර කුමක් ද?

74. 3 වැනි විත්තිකරුගේ එකී සහතික සනාථ කිරීම පිණිස නියම කරනු ලැබූ ප්‍රමාණයන් පිළිබඳ බිල්පත් සහ අවසන් මිණුම් වාර්තා කොළඹ හිල්ටන් හෝටලය ඉදි කිරීමේ හරිවැරදිතා පිරික්සීම සඳහා 4 වැනි විත්තිකාර සමාගම සතුව නොමැති බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නොමැති නම් නිවැරදිතාවය පරික්ෂා කරනුයේ කෙසේ ද? එසේ නම් මේ සම්බන්ධව ඔබ ගත් ක්‍රියාමාර්ගය කුමක් ද? නැතිනම් ඒ මන්ද?

75. කොළඹ හිල්ටන් හෝටලයට ගෘහ භාණ්ඩ සවිකිරීම සහ උපකරණ සැපයීම පිළිබඳව නියම කරනු ලැබූ සැපයුම් ගිවිසුමට 'ඒ' වශයෙන් යාකොට තිබූ ප්‍රදර්ශිත ලේඛණය ද ප්‍රශ්නයකට තුඩුදෙන අයුරින් සහ/හෝ 4 වැනි විත්තිකාර සමාගමේ කාර්යාලයෙන් හිතාමතාම යටපත් කොට ඇති බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන්ද? එසේ වූයේ නම්, ඔබගේ නියෝජිතයා එම කාර්යාලය භාරව සිටි විධායක අධ්‍යක්ෂ නිසා ඔබ ගත් ක්‍රියා මාර්ගය කුමක් ද? නැතිනම් ඒ මන්ද?

76. එම 'ඒ' ප්‍රදර්ශිත ලේඛණය නොමැතිව කොළඹ හිල්ටන් හෝටලයට සැපයූ එම ගෘහ භාණ්ඩ සවි කිරීම් සහ උපකරණවල වර්ගයන් නියමිත ප්‍රමාණයන්වල නිවැරදිතාවය පිරික්සීමට 4 වැනි විත්තිකාර සමාගමට නොහැකි බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ කෙසේ ද? එසේ වී නම්, ඒ සම්බන්ධයෙන් ඔබ ගත් ක්‍රියාමාර්ගය කුමක් ද?

77. ඉහත කී ණය ගිවිසුම් යටතේ ඔබ විසින්ම සපයනු ලැබූ ණය මුදල්වලින් ඔබ ගෙවීම් ලබාගනු ලැබුවේ හුදෙක් කාලයාගේ ඇවෑමෙන් වූ පදනම මත බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඔබ ගෙවීම් ලබා ගත්තේ කුමන පදනමක් මත ද?

78. එවැනි ගෙවීම් ඔබ වෙත ගෙවීමට නිර්මාණ ශිල්පීන් 3 වැනි විත්තිකරු විසින් සම්ප්‍රදායික ලෙස නිකුත් කරනු ලැබූ වැඩ පිළිබඳව අතුරු සහතික නොතිබුණු බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම්, එම ගෙවීම් කිරීමේ සහතික ඇත්තේ කොහේ ද?

79. ඉහත කී නොයෙකුත් වැදගත් ලේඛණ නොමැතිව එකඟ වන ලද වර්ගයන් මිල නියමයන්, ප්‍රමාණයන් සහ අගයන් අනුව එවැනි භාණ්ඩවලින් පරිපූර්ණ වූ කොළඹ හිල්ටන් හෝටලය ඉදි කිරීමේ සහ භාරදීමේ කටයුතුවල නිවැරදිතාවය පිරික්සීමට 4 වැනි විත්තිකාර සමාගමට නොහැකි බව ඔබ පිළි ගන්නෙහි ද? නොඑසේ නම් එම නිවැරදිතාවය සම්බන්ධව හරි වැරදි බැලිය හැක්කේ කෙසේ ද?

80. පූර්වෝක්ත සම්බන්ධතාවයන් අනුව, 4 වැනි විත්තිකාර සමාගම විසින් ඔබ වෙත ගෙවීම් කිරිම සඳහා වලංගු සතුටුදායක සහ පිළිගත හැකි පදනමක් නොමැති බව ඔබ පිළි ගන්නෙහි ද? එසේ නැතිනම් ඒ මන් ද?

81. මෙම නඩුවේ විමසීමකින් පසුව, අතුරු තහනම් නියෝග නිකුත් කරමින්, උගත් දිසා විනිසුරුතුමා විසින් කරන ලද නියෝගයේ වෙනත් කරුණු අතර, ඔබ වෙත මුදල් ගෙවිම සඳහා දැනට පිළිගත හැකි පදනමක් නොමැති බව නිරික්ෂණය කළ බව ඔබ පිළි ගන්නෙහි ද?

82. හෝටල් අමුත්තන්ගේ කාමර 452 මත කාමර ආදායම් ගණන් බැලීමේ පදනම මත කොළඹ හිල්ටන් හෝටලයට ලාභදායි පූර්වානුමාන ප්‍රකාශ සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපන 4 වැනි විත්තිකාර සමාගමට ඉදිරිපත් කිරිම සඳහා ඔබ විසින් පිළියෙළ නොකරනු ලැබුවේ ද? එසේ නැතිනම්, ගණන් බලන ලද්දේ කුමන පදනමක් මත ද?

83. ඉන්අනතුරුව, අමුත්තන්ගේ කාමර සංඛ්‍යාව පිළිබඳව පැමිණිලිකරු විසින් ප්‍රශ්න මතු කළ විට, ඔබ විසින් ප්‍රතිශෝධිත ලාභදායි සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපණයන්, කාමර ආදායම හෝටල් අමුත්තන්ගේ කාමර 387 ක පදනම මත ගණන් බලා පිළියෙල කොට 4 වැනි විත්තිකාර සමාගම වෙත ඔබ, ඉදිරිපත් නොකළෙහි ද? එසේ නැත්නම් ගණන් බලන ලද්දේ කුමන පදනමක් මත ද?

84. 4 වැනි විත්තිකාර සමාගම සමඟ ක්‍රියා කරමින්, අමුත්තන්ගේ කාමර 452 ක පදනමක් මත හෝටල කාමර ආදායම ගණන් බලා ණය මුදල් ආපසු ගෙවීමේ හැකියාව පෙන්නුම් කර පූර්වානුමාන ලාභදායි ප්‍රකාශ සහ මුදල් ගැලීම් ප්‍රක්ෂේපණවල පදනම මත ශ්‍රී ලංකා රජය සහ/හෝ එහි නිලධාරින් සහ/හෝ නියෝජිතයින් වෙත කරුණු ගෙනහැර දක්වමින්, සම්මුති සාකච්ඡා කොට කොළඹ හිල්ටන් හෝටලය ඉදිකර භාරදීම සඳහා ඉහත කී රජයේ ඇප සහතික පත් ඔබ විසින්ම සැලසූ ණය මුදල් මත ඉල්ලුම්කර භාර නොගත්තෙහි ද? එසේ නැතිනම් ඒ මන් ද?

85. ඔබ 4 වැනි විත්තිකාර සමාගමේ ව්‍යාපාර ප්‍රකාශ පත්‍රයේ නම් කරනු ලැබූ ප්‍රවර්ධකයින් සහ එයට ඔබගේ නියෝජිතයින් මගින් අත්සන්කරුවන් වශයෙන් ශ්‍රී ලංකාවේ ආයෝජනය කරනු ලබන මහජනයාට සහ අදාළ ව්‍යවස්ථාපිත බලධාරීන් වෙත එහි නයම කර ඇති පරිදි කොළඹ හිල්ටන් හෝටලයේ වෙනත් දෑ අතර, කාමර (එනම් කළමනාකරුගේ වාසස්ථානයන් වශයෙන් කාමර හතරක් ඉවත් කර හෝටල අමුත්තන්ගේ කාමර) 452 කින් මහල් 22 උසට විහිදෙන රථවාහන 400 ක් සඳහා ආවරණය කළ (එනම් පතුල් මහලේ) රථ ගාලකින් ද සමන්විත වන බවට කරුණු ගෙනහැර දක්වමින් දන්වා නොසිටියෙහි ද?

1992 මාර්තු මස 06 දිනදී ය.

Desilwa

පැමිණිලිකරුගේ නීතිඥයින්.